කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

---

**2020 දෙසැම්බර් මස 05 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2020 දෙසැම්බර් මස 04 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**"බුරවි" සුළි කුණාටුව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා දුර්වල වී තවදුරටත් දිවයිනෙන් ඉවතට ගමන් කරමින් පවතින අතර එය අද (දෙසැම්බර් 04 ) පෙ.ව 05.30 වන විට මන්නාරමට කි.මී. 145 ක් බටහිර දෙසින් ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතියේ බලපෑම ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.**

උතුරු, උතුරු මැද සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.
බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත්, විශේෂයෙන්ම උදෑසන කාලයේදී තැනින් තැන වැසි ඇති විය හැක.
ඌව සහ නැගෙනහිර පළාත්වල සවස 2.00 න් පසු ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

උතුරු, උතුරු මැද සහ වයඹ පළාත්වල විටින් විට පැ.කි.මී.( 40-50) පමණ දක්වා වන සුළං ඇති විය හැක.

## WEATHER FORECAST FOR 05 DECEMBER 2020
## Issued at 12.00 noon on 04 December 2020

**The cyclonic storm 'BUREVI' has weakend into a Deep depression and located about 145 km to the West of Mannar at 05.30 a.m today. It is moving further away from the country. Hence the influence of this system is expected to be gradually reduced.**

Showers or thundershowers will occur at times in the Northern, North-central and North-western provinces.
Showers can be expected at several places in Western, Sabaragamuwa and Central provinces and in Galle and Matara districts, particularly in the morning.
Showers or thundershowers may occur at a few places in Uva and Eastern provinces after 2.00p.m.

Wind speed can be increase up to (40-50) kmph at times in Northern, North-Central and North-western provinces.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2020 දෙසැම්බර් මස 04 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

"බුරවි" සුළි කුණාටුව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා දුර්වල වී තවදුරටත් දිවයිනෙන් ඉවතට ගමන් කරමින් පවතින අතර එය අද (දෙසැම්බර් 04 ) පෙ.ව 05.30 වන විට මන්නාරමට කි.මී. 145 ක් බටහිර දෙසින් ස්ථානගතව පැවතුනි.

හෙට දින (05) උදෑසන කාලය වනතුරු පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල තවදුරටත් ධිවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මෙම මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට තද වැසිද ඇතිවිය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා මුලතිව් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත සිට ගිනිකොණ දක්වා දිශාවලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (50-60) පමණ වේ. විටින් විට පැ.කි.මී. 70 දක්වා වැඩිවිය හැක.
පුත්තලම සිට කොළඹ සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ. විටින් විට පැ.කි.මී. 50 දක්වා වැඩිවිය හැක.

සෙසු මුහුදු ප්‍රදේශවල සුළං දකුණ සිට ගිනිකොණ දක්වා දිශාවලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.

**මුහුදේ ස්වභාවය:**

පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු විය හැක.
ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**

**Issued at 12.00 noon on 04 December 2020**

**The cyclonic storm 'BUREVI' has weakend into a Deep depression and located about 145 km to the West of Mannar at 05.30 a.m today. Naval and fishing communities are advised not to venture into the deep and shallow sea areas off the coast extending from Puttalam to Kankasanthurai via Mannar, until tomorrow (05) morning.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the deep and shallow sea areas extending from Puttalam to Trincomalee via Mannar and Kankasanthurai. Heavy showers can be expected at some places in the above sea areas. Showers will occur at a few places in the other sea areas around the island.

**Winds:**

Winds will be south-westerly to south-easterly in the sea areas extending from Puttalam to Mullaitivu via Mannar and Kankasanthurai . Wind speed will be **(50-60) kmph** and wind speed can increase up to **70 kmph** at times over these sea areas.

Winds will be westerly to south-westerly in the sea areas extending from Puttalam to Pottuvil via Colombo and Hambantota. Wind speed will be (30-40) kmph and wind speed can increase up to 50 kmph at times.

Winds will be southerly to south-easterly in the other sea areas around the island and the wind speed will be **(30-40) kmph**.

**State of Sea:**

**The deep and shallow sea areas off the coast extending from Puttalam to Kankasanthurai via Mannar can be very rough at times.**

The sea areas extending from Galle to Pottuvil via Hambanthota can be rough at times.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි